බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව

# පුරප්පාඩු

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා මෙහි සඳහන් අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් කොන්ත්‍රාත් පදනම මත ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

## තනතුර - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල් සහ පාලන (H M 1-1)

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් සමඟ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම සහ ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමණාකරණ මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද.

**දීමනාව** - කළමණාකරන සේවා චක්‍රලේඛ අංක 02/2016 HM1-1

- රු. 80,295 /=( අමතරව රජය මගින් අනුමත අනෙකුත් දීමනා)
- මෙම තනතුරට අදාල නිල ප්‍රවාහන පහසුකම් සපයනු ලැබේ

**වයස් සීමාව-** අවු 55 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් .

**තනතුරේ ස්වභාවය හා සේවා කොන්දේසි**

මෙම බඳවා ගැනීම් මූලික වශයෙන් මාස 06 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වන අතර, තනතුරේ අවශ්‍යතාවය සහ සතුටුදායක කාර්යය සාධනය මත සේවා කාලය කොන්ත්‍රාත් පදනම මත දීර්ඝ කිරීමේ අවස්ථාව පවතී. එමෙන්ම ලිත් මසක දැනුම් දීමකින් කොන්ත්‍රාත් කාල සීමාව අවසන් කිරීමට පත්වීම් බලධාරියාට හැකියාවක් ඇත. සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තීන්ගේ අරමුදල සඳහා දායකවිය යුතුය.

## තනතුර - සහකාර සාමාන්‍යාධිකාරී - නීති (M M 1-1)

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිය පිළිබඳ උපාධිය සමඟ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී වසර 03 ක පළපුරුද්ද. හෝ

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීති ඇටෝර්නි විභාගය සමත්වී ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු වසර 03 පළපුරුද්ද.

**දීමනාව** - කළමණාකරන සේවා චක්‍රලේඛ අංක 02/2016 MM1-1

- රු. 53,175 /=( අමතරව රජය මගින් අනුමත අනෙකුත් දීමනා)

**වයස් සීමාව-** අවු 45 ට නොවැඩි විය යුතුය.

## තනතුර - සහකාර සාමාන්‍යාධිකාරී - අලෙවි, නිෂ්පාදන හා පර්යේෂණ (M M 1-1)

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ජන සන්නිවේදනය/ ප්‍රසංග කලා අධ්‍යයනය හා සිනමාකරණය/ කළමණාකරණය පිළිබඳ ප්‍රථම උපාධිය සහ රජයේ පිළිගත් ආයතනයක වසර 03 ක පළපුරුද්ද.

**දීමනාව** - කළමණාකරන සේවා චක්‍රලේඛ අංක 02/2016 MM1-1

- රු. 53,175 /=( අමතරව රජය මගින් අනුමත අනෙකුත් දීමනා)

**වයස් සීමාව-** අවු 45 ට නොවැඩි විය යුතුය.

## තනතුර - මාධ්‍ය හා ප්‍රචාරණ නිළධාරී (J M 1-1)

**සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ජන සන්නිවේදනය පිළිබඳ උපාධියක් සමඟ උපාධි සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක /සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක එක් අවුරුදු පළපුරුද්ද.

**දීමනාව** - කළමණාකරන සේවා චක්‍රලේඛ අංක 02/2016 JM1-1

- රු. 42,600 /=( අමතරව රජය මගින් අනුමත අනෙකුත් දීමනා)

**වයස් සීමාව-** අවු 45 ට නොවැඩි විය යුතුය.

**බඳවා ගැනීමේ ක්‍රමය**

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් .

**තනතුරේ ස්වභාවය හා සේවා කොන්දේසි**

මෙම බඳවාගැනීම මූලික වශයෙන් මාස 06 ක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත වන අතර , තනතුරේඅවශ්‍යතාවය සහ සතුටුදායක කාර්යය සාධනය මත සේවා කාලය කොන්ත්‍රාත් පදනම මත දීර්ඝ කිරීමේ අවස්ථාව පවතී. එමෙන්ම ලිත් මසක දැනුම් දීමකින් කොන්ත්‍රාත් කාල සීමාව අවසන් කිරීමට පත්වීම් බලධාරියාට හැකියාවක් ඇත. සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තීන්ගේ අරමුදල සඳහා දායකවිය යුතුය.

**අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් සහ යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, පහත සඳහන් ලියකියවිලිවල ජායා පිටපත් සිය අයදුම්පත් සමඟ අමුණා එවිය යුතුය.**

1. අධ්‍යාපන සහතිකවල පිටපත්
2. උප්පැන්න සහතිකයේ පිටපතක්
3. පළපුරුද්ද පිළිබඳ සහතික පිටපත්

**අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය**

I. ඉහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් විසින් සකස් කරන ලද සියලු ජීව දත්ත ඇතුලත් අයදුම්පත, ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් දුරකථන අංක සහිතව 2022 /03/11 දිනට පෙර සභාපති, ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, නො.303 බෞද්ධාලෝක මාවත, කොළඹ 07. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත්‍රයේ සඳහන් සියලු තොරතුරු සනාථ කිරීමට අදාල ලේඛනවල පිටපත් සහතික කර අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය. ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

II. අයදුම්පත් භාර ගන්නා දිනට පසුව ලැබෙන අයදුම්පත් පිළිගනු නොලැබේ. අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ බඳවා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් ඔබ මෙම තනතුරට නුසුදුස්සෙකු සේ සලකනු ලබන අතර පත්වීම අවසන් කිරීමටද එය හේතු වේ.

III. මේ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු චිත්‍රපට සංස්ථා වෙබ් අඩවියෙන් (www.nfc.gov.lk) හෝ 0112-580371 දුරකතන අංකය මඟින් ලබා ගත හැක.

සභාපති
ජයන්ත ධර්මදාස
ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව, 303, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.